# රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් හමුවන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන පිළිබඳ මූලික අධ්‍යයනයක්

ගම්පොල විජය හිමි

## පූර්විකා

ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වැදගත් ස්ථානයක් හිමිකර ගනියි. පුරාවිද්‍යා මූලාශ්‍ර අතරින්ද ශිලා ලේඛනයන්ට ප්‍රමුඛ ස්ථායක් ලැබේ. ලංකාවේදී විවිධ යුගයන්ට අයත් ශිලා ලේඛන හමුවී ඇත. මේ අයුරින් හමුවන ශිලා ලේඛනයන්හි අන්තර්ගතයෙන් ලංකා ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කිරීමට සමත්ව ඇත. මේ අකාරයෙන් ලංකා ඉතිහාසයේ වැදගත් වූ ඓතිහාසික සංසිද්ධීන් සම්බන්ධ ශිලා ලේඛන සාධක හමුවන ස්ථානයක් වශයෙන් රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රය දැක්විය හැකිය. පූර්ව බ්‍රාහ්මී යුගයට අයත් ශිලා ලේඛන බහුල වශයෙන් හමුවන රජගලින් ලංකා ඉතිහාසයේ වැදගත් සංසිද්ධියක් වන මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනය තහවුරු කරනු ලබන ශිලා ලේඛනයක්ද හමු විය. එසේම භික්ෂූන් උදෙසා පූජා කළ ලෙන් පිළිබඳ සඳහන්ව ඇති ශිලා ලේඛනද ලෙන් ආශ්‍රිතව දැකිය හැකිය. මේ අනුව රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ශිලා ලේඛන පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු ද කිරීම මෙහි පරමාර්ථයයි.

## රජගල විහාරය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ රජගලතැන්න ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති රජගල වනාහි ලංකාවේ දැකිය හැකි වැදගත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයකි. ක්‍රි.පූ. 1වන සියවසේ සිට ක්‍රි.ව. කාලය දක්වා වූ ශිලා ලේඛන ගණනාවක් තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රය ආශ්‍රිතව දක්නට හැකිය. දුටුගැමුණු රජතුමාගේ සහෝදරයෙකු වන සද්ධාතිස්ස කුමරුගේ පුත්‍රයා වන ලජ්ජිතිස්ස රජතුමා විසින් ක්‍රි.පූ. 119-109 වැනි කාලයේ මෙම විහාර සංකීර්ණය ආරම්භ කළ බව මහා වංශයේ සඳහන් වෙයි.[1] ලජ්ජිතිස්ස රජතුමාගේ කාලයේ ස්ථාපනය කළ ශිලා ලේඛන සහිත ලෙන් ගණනාවක් මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දැකිය හැකි අතර අනුරාධපුර යුගයේ රජගල විහාර සංකීර්ණය විවිධ වූ නාමයන්ගෙන් හඳුන්වා ඇත. ගිරි කුම්බල විහාරය, අරියකර විහාරය, අරිත්තර විහාරය, තිස්ස පබ්බත, රචගල ආදී වූ නාමයන්ගෙන් තත් විහාරය පිළිබඳ දීපවංශය, මහාවංශය, සහස්ස වත්ථුප්පකරණය, සිංහල වත්ථුව ආදී වූ ග්‍රන්ථයන්හි සඳහන් වී ඇත. රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් හමුවන අභිලේඛනයක දැක්වෙනුයේ තත් විහාරය ''ධනතිස පවත'' යනුවෙන් හැඳින් වූ බවකි. මෙම රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විශාල වශයෙන් ආරාම සංකීර්ණයක් වූ බව වර්තමානයේ දක්නට ලැබෙන සාධකයන් ඇසුරෙන් පෙන්වාදිය හැකිය. අතීතයේ ග්‍රාමවාසී හා වනවාසී වශයෙන් කොටස් දෙකකින් යුක්තව පැවැති බව පුරාවිද්‍යා සාධක මගින් තහවුරු වේ. මිහිඳු මහරහතන් වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කොට කළු ගල් භාවිතයෙන් නිර්මාණය කළ චෛත්‍යක්ද මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දක්නට ලැබේ.

මෙවැනි ඓතිහාසික පසුබිමකින් යුක්ත වූ රජගල භූමියේ විශාල වශයෙන් පුරාවිද්‍යාත්මක සාධක දක්නට ලැබේ. ආරාම, පොහොය ගෙවල්, ගල් පාත්‍රා, බුද්ධ පිළිම, චෛත්‍ය, පොකුණු, ශිලා ලේඛන ආදී වශයෙන් එම නිර්මාණ දැක්විය හැකිය. මෙම පුරාවිද්‍යා සාධක අතරින් ශිලා ලේඛන ඉතා වැදගත් තැනක් ගනු ලැබේ. පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විවිධ තැන්හි විවිධ යුගයන්ට අයත් ශිලා ලේඛන දක්නට ලැබේ. ඇතැම් ශිලා ලේඛන පිටපත් කර ඇති අතර ඇතැම් ඒවා පිටපත් කර නොමැත. ශිලා ලේඛන වනාහි ඉතිහාස අධ්‍යයනයේදී ප්‍රබල

දායකත්වයක් ලබා දෙයි. රජගල අවට දක්නට ලැබෙන ශිලා ලේඛන වර්ග කිරීමේදී විවිධ වූ තේමාවන් යටතේ දැක්විය හැකිය.

- මිහිඳු මහ රහතන් වහන්සේ හා ඉට්ඨිය තෙරුන් පිළිබඳ සඳහන්ව ඇති ශිලා ලේඛනය
- රජවරුන් හා කුමර-කුමරියන් භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි
- පරුමක හා ගමිකවරුන් භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි
- සාමාන්‍ය ජනයා භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි
- පුද්ගල නාම හා තනතුරු නාම සඳහන් ලිපි
- ලෙන් නාම, ගුහා නාම හා පර්වත නාම සඳහන් ලිපි

## මිහිඳු මහ රහතන් වහන්සේ හා ඉට්ඨිය තෙරුන් පිළිබඳ සඳහන් වී ඇති ශිලා ලේඛනය

''යේ ඉම දීප පටමය ඉදිය අගතන ඉදික තෙර-මහිද තෙරහ තුබෙ''[2] යනුවෙන් මහින්ද හා ඉට්ඨිය තෙරුන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කොට නිර්මාණය කරන ලද කුඩා චෛත්‍යය පිළිබඳ සඳහන් වනු ලැබේ. මහාවංශයට අනුව දේවානම්පිය තිස්ස රජතුමාගේ කාලයේ මහින්ද තෙරුන් ප්‍රමුඛව ඉත්තිය, උත්තිය, සම්භල, භද්දසාල, සුමන සාමණේර, භණ්ඩුක උපාසක යන පිරිස් සමඟ ලංකාවට බුද්දහම රැගෙන පැමිණීමෙන් ලක්දිව බුද්දහම පිහිට වූ බව සඳහන්ය.[3] මහාවංශයේ දක්වනු ලබන තත් කරුණු සනාථ කිරීමට ඇති පුරාවිද්‍යා මූලාශයක් ලෙස රජගල පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිය දැක්විය හැකිය. මෙම ශිලා ලේඛනයට අනුව මහින්ද මහ රහතන් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි ඉත්තිය, උත්තිය ආදී පිරිස ඓතිහාසික පුද්ගලයන් වන බව දැක්විය හැකිය. ශිලා ලේඛනයෙන් මිහිඳු මහ රහතන් වහන්සේගේ හා ඉත්තිය තෙරුන් යන දෙදෙනාගේ භෂ්මාවශේෂ තැන්පත් කොට චෛත්‍යය නිර්මාණය කළ බව සනාථ වේ. ශිලා ලේඛනයේ දැක්වෙන පරිදි ''යේ ඉම දීප පටමය'' යන්න විග්‍රහයට බඳුන් කරන සෙනරත් පරණවිතාන පෙන්වා දෙනු ලබන්නේ ''මෙම දීපයට පූර්ව වාසනාවකට පැමිණි'' යන අදහස ගම්‍ය වන බවයි. අනෙකුත් විචාරකයන් පෙන්වා දෙනු ලබන්නේ මෙම දීපයට සෘද්ධියෙන් පැමිණි යන අරත ඉන් ධ්වනිත වන බවකි. මෙම ශිලාලේඛනයේ දැක්වෙන ආකාරයට ''තුබෙ'' යන්න ස්තූපය සඳහා භාවිත වී ඇත. එසේම ධාතූන් වහන්සේලා තැන්පත් කොට චෛත්‍යය නිර්මාණය කිරීම අතීතයේ සිට පැවැති දෙයක් බව සනාථ කිරීමට ප්‍රමුඛ සාධකයක් වශයෙන් මෙම ශිලා ලේඛනය දැක්විය හැකිය.

## රජවරුන් හා කුමර-කුමරියන් භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි

''දෙවන පිය මහරඣහ ගමණී තිශහ පුත මහ යශ ඣය උපශික බුතදතය ලෙණෙ අගත අනගත චතු දිශ ශගශ''[4] යනුවෙන් ක්‍රි.පූ. 01වන සියවසේ ලියවී ඇති ලෙන් ලිපිය මඟින් උපාසිකාවන් විසින් බුදු සසුන උදෙසා පූජාකරන ලද ලෙන් පිළිබඳ සඳහන්ය. උක්ත ලිපියේ අන්තර්ගතය පිළිබඳ සඳහන් කිරීමේදී දෙවන පිය ගාමිණී තිස්ස මහ රජුගේ පුත් තිස්ස කුමාරයාගේ භාර්යාව වූ උපාසිකා බුද්ධදත්තාගේ ලෙන පැමිණි නොපැමිණි සතර දිශාවේ මහා සංඝයාට පූජා කෙරේ යන්න සඳහන් වේ.

''දෙවන පිය මහරඣ ගමිණි තිශහ පුත මහ අයහ ඣය උපශික යහශිනිය ලෙණෙ''[5] යනුවෙන් දෙවන පිය මහරජ ගාමිණී තිස්සගේ පුත් කුමරුවාගේ භාර්යාව වූ උපාසිකා යසස්සිනීගේ ලෙන භික්ෂූන් උදෙසා පූජා කිරීමක් සිදුව ඇත. මෙහි පැමිණි නොපැමිණි සතර දිශාවේ මහා සංඝයාට යනුවෙන් සඳහන්ව නැතත් භික්ෂූන් උදෙසා මෙම ලෙන පූජා කර ඇත.

''දෙවන පිය මහරඣහ ගමිණි තිශහ පුත මහ අයහ මහ ලෙණෙ''[6] දෙවන පිය මහරජ ගාමිණී තිස්සගේ පුත් කුමරාගේ මහ ලෙන මහා සංඝයාට පරිත්‍යාගය කිරීම පිළිබඳ සඳහන් වනු ලැබේ. මේ අනුව රජ කුමාරවරුන් විසින් භික්ෂූන් උදෙසා ලෙන් පූජාකිරීම සිදුව ඇත.

''දෙවන පිය මහරඣ ගමිණි තිශහ පුත තිශයහ ඣය අබිඣතිය ලෙණෙ''[7] දෙවන පිය ගාමිණී තිස්ස මහ රජුගේ පුත්‍ර තිස්සගේ භාර්යා අභිජාතාගේ ලෙණ සංඝයාට පරිත්‍යාගය කිරීම පිළිබඳ සඳහන් වනු ලැබේ. මෙම ශිලා ලේඛනයට අනුව භික්ෂූන් උදෙසා ලෙන් පූජා කර ඇත්තේ කුමාරිකාවක් විසිනි. මේ අනුව ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව රජ කුමර කුමරියන් භික්ෂූන් වහන්සේලා උදෙසා පූජාවන් සිදු කර ඇත. විශේෂයෙන් රජකුමරුවන්ගේ ප්‍රිය භාර්යාවන් මේ ආකාරයෙන් ලෙන් පූජා කිරීම විවිධ කාලවකවානුවල සිදුව ඇත.

''දෙවන පිය මහරඣ ගමිණි තිශහ පුතලඣක රඣහ ඉධ පතිටපිත සිත ලෙණෙ පචවීසති''[8] දෙවන පිය ගාමිණී තිස්ස මහ රජුගේ පුත්‍ර ලජ්ජිතිස්ස රජු විසින් මෙහි ශීත ලෙන් විසිපහ නිර්මාණය කොට භික්ෂූන්ට පූජා කරන ලදී. ලජ්ජිතිස්ස රජු විසින් භික්ෂූන්ට උෂ්ණ කාලයේදී විවේක සුවයෙන් ගත කිරීමට ශීත ලෙන් නිර්මාණයන් සිදු කළ බව මෙම ශිලා ලේඛනයෙන් අන්තර්ගතයෙන් තහවුරු වේ. ශීත ලෙන් විසි පහක් නිර්මාණය උපකල්පනය වනුයේ විශාල භික්ෂූන් ප්‍රමාණයක් වැඩ සිටි ආරාමයක් වශයෙන් රජගල විහාරය සමකාලයේ ප්‍රසිද්ධව තිබූ බවකි. එසේම වර්තමානයේ පවා මෙම ප්‍රදේශය ආශ්‍රිතව යම් තරමක උණුසුම් කාලගුණ තත්වයක් දක්නට හැකි අතර අතීතයේද ඒ ආකාරයෙන් තිබෙන්නට ඇති බවක් උපකල්පනය කළ හැකිය. එලෙස නිර්මාණය කරන ලද ශීත ලෙන් වර්තමානයේ පවා දක්නට ලැබෙන බැවින් ශිලා ලේඛනයේ සඳහන් පිදීම යථාර්තයක් වන්නට ඇත.

''දෙවන පිය මහරඣහ ගමිණි තිශහ පුතහ තිශ අයහ ඣය උපශික ශමිකය ලෙණෙ''[9] දෙවන පිය මහරජ ගාමිණී තිස්සගේ පුත් කුමරාගේ භාර්යාව වූ උපාසිකා සාමිකාගේ ලෙන මහා සංඝයාට පරිත්‍යාගය කිරීම පිළිබඳ සඳහන් වනු ලැබේ. උක්ත ශිලා ලේඛන කිහිපයේ දැක්වෙන පරිදි දෙවන පිය මහරජ ගාමිණී තිස්සගේ පුත් කුමරා හා ඔහුගේ භාර්යාවන් මැදිහත් වීමෙන් තත් ලෙන් කිහිපය පූජා කරන ලදී. මේ අනුව මහරජ ගාමිණී තිස්සගේ පුත් කුමරුන් හට භාර්යාවන් කිහිප දෙනකුම සිටි බව දක්වන්නට හැකි අතර ඔවුන් බුද්ධසසුන වෙනුවෙන් විශාල වශයෙන් අනුග්‍රහයන් සිදු කළ බවද දක්වන්නට හැකිය. මෙම පූජා කර ඇති ලෙන් විශාල ප්‍රමාණයක විවිධ ප්‍රමාණයේ කටාරම් දැකගත හැකිය. මේ ආකාරයෙන් කටාරම් සහිත ලෙන් භික්ෂූන්ට පූජා කිරීමට සඳහා විශාල වූ ආර්ථික ශක්තියක්ද තිබිය යුතු වන්නේය. මේ අනුව උපාසිකා යන තනතුරු නාමයෙන් හැඳින්වූවද මොවුන් වනාහි කුමාරිකාවන් වන්නට ඇත. එසේම තත් ශිලා ලේඛනයන්හි දෙවන ප්‍රිය නාමය දක්වා ඇත. මේ අනුව මෙම නාමය පරම්පරානුකූලව ගමන් කළ බවක් දක්වන්නට හැකිය. ප්‍රථම වරට දෙවන ප්‍රිය නාමය දේවානම් පියතිස්ස රජතුමා විසින් භාවිතයට ගන්නා අතර පසු කාලීනව විවිධ රජවරුන් විසින් දෙවනප්‍රිය නාමය භාවිත කළ බව ශිලා ලේඛන මඟින් තහවුරු වේ.[10] මෙම නාමය පසු කාලීන රජවරුන් විසින්ද ගෞරවනීය නාමයක් වශයෙන් තම නාමයට ඉදිරියෙන් හෝ පසු පසින් භාවිත කර ඇත.

උක්ත ශිලා ලේඛනයන්ට අනුව පෙනී යන්නේ විශාල වශයෙන් රාජ්‍ය අනුගහයක් මෙම විහාරය සඳහා අතීතයේ ලැබී ඇති බවකි. සද්ධාතිස්ස රජුගේ පුත්‍රයා වූ ලජ්ජිතිස්ස රජතුමා විසින් විශාල වශයෙන් අනුග්‍රහ කර ඇති බවක් දක්නට ලැබේ. එසේම තිස්ස කුමරුගේ ප්‍රිය භාර්යාවන්ද තත් විහාරයේ භික්ෂූන් හට පිදීම් බහුල වශයෙන් සිදු කර ඇත.

## පරුමක හා ගමිකවරුන් භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි

ක්‍රි.පූ. 3 කාලයේ පටන් ක්‍රි.ව. 3-4 දක්වා ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානයන්ගෙන් පරුමකවරුන් පිළිබඳ පුරාවිද්‍යාත්මක ශිලා ලේඛන සාධකයන් දැකගත හැකිය. ක්‍රි.පූ. 3 කාලයේ පටන් ක්‍රි.ව. සියවස් කාලය දක්වා භික්ෂූන්ට පූජා කළ ලෙන් ආශ්‍රිතව පරුමක, භඩගරික, ගමික, ගහපති ආදී නාම සහිත ශිලා ලේඛන දක්නට ලැබේ.[11] පරුමක නාමය පිළිබඳ විවිධ විද්වත් මත දක්නට ඇත. පරුමකවරුන් සම්බන්ධව දැනට ඉදිරිපත් කර ඇති ප්‍රධාන මතවාද කිහිපයකි. එනම්,

- H.C.P මහතා අර්ථකථනය කරනු ලබන්නේ පරුමක යන්න ප්‍රධාන, මූලිකයා යන්නයි.
- සෙනරත් පරණවිතාන මහතා පරුමකවරුන් හඳුන්වනුයේ ඉන්දියානු ආර්ය පරපුරකට අයත් විශේෂ ජන පිරිසක් වශයෙනි.
- මහාචාර්ය සුදර්ශන් සෙනවිරත්න මහතා පරුමකවරුන් පිළිබඳ අර්ථ කථනය කරනු ලබන්නේ දකුණු ඉන්දියානු ජන සම්භවයක් සහිත පිරිසක් වශයෙනි.

මේ ආදි වශයෙන් පරුමකවරුන් පිළිබඳ විවිධ වූ මතවාදයන් දැක ගැනීමට ලැබේ. රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි ඇතුළත් වන පුද්ගල තනතුරු නාමයක් වශයෙන් පරුමක නාමය දැක්විය හැකිය. රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි පරුමක නාමය බහුල වශයෙන් දක්නට නොමැති අතර ශිලා ලේඛන කිහිපයක පමණ මෙම නාමය ඇතුළත්ව තිබේ.

සෙනරත් පරණවිතාන මහතා විසින් රචිත ලංකාවේ ශිලා ලේඛන පළමු වෙළුම (Inscriptions of Ceylon, vol:1) ග්‍රන්ථයේ මිහින්තලය පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි 3, 7, 9, 19, 20, 25, 30, 38, 42, 59, 61, 62, 64, 72 ආදී වූ ශිලා ලේඛනයන්හි පරුමක යන තනතුරු නාමය පුද්ගල නාමයන් හා සම්බන්ධ වෙමින් භාවිත වී ඇත. මෙම ශිලා ලේඛනයන්ට අමතරව ලංකාවේ බොහෝ පුරාවිද්‍යා ස්ථානයන්හි පරුමක නාමය සහිත ශිලා ලේඛන දක්නට ලැබේ.

ප්‍රමුඛ, පරුමක, පරුමුක, පරුමුකා, පරුමය, පරුමු ආදී වශයෙන් මෙම නාම ව්‍යවහාරය ශත වර්ෂ ගණනාවක් ඔස්සේ විවිධ ආකාරයෙන් භාවිත වී ඇති බවක් දක්නට ලැබේ. පසු කාලීනව 'මහා' යන භාවිතය එකතු වී මහාපරුමක, මපුරුමුක ආදී වශයෙන් භාවිතය සිදු වූ බව සඳහන් වේ.[12] පරුමක හා මපුරුමුක යන්න ප්‍රදේශීය පාලකයන් හා රජවරුන් උදෙසා භාවිත වූ බවක් ශිලා ලේඛන අධ්‍යයනයේදී දක්නට ලැබේ. විද්වත් මතවාදයන්ට අනුව පරුමක යන්න පාරම්පරිකව පැවැතෙන විරුද නාමයකි. මෙය අධිපති යන්න සඳහා භාවිත වී ඇති බවක් දක්නට ලැබේ. රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හිද පරුමක නාමය භාවිත වී ඇති බවක් දැකගත හැකිය.

රජගල පමණක් නොව මිහින්තලය, බඹරගල, දූල්වල-අලදෙණිය, තෝනිගල, තෝරව මයිල්ලව විහාරය, වේරගල, සැස්සේරුව, කුඩුම්බිගල, කුසලානකන්ද ආදී පුරාවිද්‍යා ස්ථාන රාශියකින් පරුමකවරුන්ගේ ලෙන් පූජා පිළිබඳ සඳහන් වේ.[13] මේ අනුව රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන දැකගත හැකි පුද්ගල නාමයන් සහිත තනතුරු නාමයක් වශයෙන් පරුමක නාමය හඳුනා ගත හැකිය. ඒ අනුව පරුමක නම් වූ තනතුර දැරූ පුද්ගලයන්ද භික්ෂූන්ට ලෙන් පූජා කළ බව රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන මඟින් හෙළි වේ.

''අබය මහරඣහ අයක ගමික අබයහ පුත ගමික චෙමහ ලෙණෙ''[14] අභය මහරජුගේ අයකැමි ගමික අභයගේ පුත් ගමික චේමගේ සමන්ත භද්‍ර ලෙන සංඝයාට දෙන ලදී. ''පරුමක පණි තිශහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ''[15] ප්‍රධාන පණිතිසගේ ලෙන පැමිණි නොපැමිණි සතර දිශාවේ මහා සංඝයාට පිදූ බව මේ අනුව

පෙන්වා දිය හැකිය. ''පරුමක අගි පුත පරුමක තෙඝධශ ලෙණෙ''[16] ප්‍රධාන අග්ගිගේ පුත්‍ර ප්‍රධාන තෙජසගේ ලෙන(සංඝයාට පරිත්‍යාග කිරීම). ''පරුමක ගොදක පුත ශුමහ ලෙණෙ''[17] පරුමක ගොදකගේ පුත් සුමගේ ලෙන(සංඝයාට පරිත්‍යාග කිරීම).

මේ අනුව රජවරුන්, කුමර-කුමරියන් පමණක් නොව පරුමක හා ගමික තනතුර දැරූ පුද්ගලයන්ද භික්ෂූන් උදෙසා ලෙන් පූජා කිරීම සිදු කළ බව දැක්විය හැකිය. පසු කාලීන විශාල වශයෙන් පරුමකවරුන් හා ගමිකවරුන් විසින් භික්ෂූන් සඳහා ලෙන් පූජා කළ බව මිහින්තලය, කුඩුම්බිගල, මහකන්ද නැගෙනහිර ගුහා ආදි ශිලා ලේඛන මඟින් තහවුරු වේ.[18]

පැරණි පාලන තන්ත්‍රයේ ග්‍රාමය පාලනය කරන ලද ප්‍රධානියා ගමික වශයෙන් දක්වා ඇත. ඇතැම් ගමිකයන්ගේ පියවරුන්ද පුත්වරුන්ද ගමිකයන් වූ බවත් පරම්පරානුගතව මෙම නිල නාමය ගමන් කළ බව ශිලා ලේඛන මඟින් තහවුරු වී ඇත. ඇතැම් ගමිකවරුන් ඇමැති, මහා ඇමති, භාණ්ඩාගාරික ආදී තනතුරු දැරූ බව මිහින්තලා ශිලා ලේඛනයන්ගේ අන්තර්ගතයෙන් පෙන්වා දිය හැකිය. මේ අනුව රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි ගමික යන පුද්ගල තනතුරු නාමයද ඇතුළත් වී ඇති අතර එක් ශිලා ලේඛනයක පමණක් සඳහන් වී ඇත.[19]

## සාමාන්‍ය ජනයා භික්ෂූන්ට ප්‍රදානය කළ ලෙන් පිළිබඳ සඳහන් ලිපි

''බත දමගුතශ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ''[20] බත ධම්මගුත්තගේ ලෙන පැමිණි නොපැමිණි සතර දිශාවේ මහා සංඝයාට පූජා කෙරේ.

''බත සමුදගුතශ ලෙණෙ ශගශ''[21] බත සමුද්ද ගුත්තගේ ලෙන මහා සංඝයාට

''තිශගුත තෙරහ ලෙණෙ ශගශ''[22] තිස්ස ගුත්ත තෙරුන්ගේ ලෙන සංඝයාට

''බත තිශහ ලෙණෙ ශුදශනෙ ශගශ''[23] බත තිස්සගේ සුදස්සන නම් ලෙන සංඝයාට

''ශුරි තෙරහ ලෙණෙ ශගශ''[24] සූරි තෙරුන්ගේ ලෙන සංඝයාට

''බත නුගහ ලෙණෙ අශ අගත අනගත චතුදිශ ශගශ''[25] බත නුගගේ අග ලෙණ පැමිණි නොපැමිණි සතර දිග මහා සංඝයාට

''ශිව තෙරශ ලෙණෙ''[26] ශිව තෙරුන්ගේ ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

''උපශක දතශ ලෙණෙ''[27]උපාසක දත්තගේ ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

''නගසෙන තෙරහ ශුදසනෙ''[28] නාගසේන තෙරුන්ගේ සුදස්සන (නම් ලෙන සංඝයාට පරිත්‍යාග කිරීම).

''බුදරකිත තෙරහ ලෙණෙ බයබෙරවෙ''[29] බුද්ධරක්ඛිත තෙරුන්ගේ භයබෙරව නම් ලෙන(සංඝයාට පරිත්‍යාග කිරීම).

''තිශබුති තෙරහ ලෙණෙ මහපදසනෙ''[30] තිස්ස භූති තෙරුන්ගේ මනාපදස්සන නම් ලෙන(සංඝයාට පරිත්‍යාග කිරීම).

''නදික තෙරහ ච බත නමලිය ච ලෙණෙ ඉදගල ගුහෙ''[31] නන්දික තෙරුන්ගේද බත නමලිගේද ඉන්දසාල නම් ගුහා ලෙන(සංඝයාට පරිත්‍යාග කිරීම).

''නග තෙරහ ලෙණෙ ඉදසල ගොහ''[32] නාග තෙරුන්ගේ ඉන්දසාල ගුහා නම් ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

''තිශමිත තෙරහ ලෙණෙ පුඩලකඩකෙ''[33] තිස්සමිත්ත තෙරුන්ගේ පුඩලකඩක නම් ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

''තිශමිත තෙරහ ලෙණෙ ශගශ''[34] තිස්සමිත්ත තෙරුන්ගේ ලෙන සංඝයාට

''උපතිශහ ලෙණෙ''[35] උපතිස්ස ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

''දමරුචි තෙරශ ලෙණෙ''[36] ධම්මරුචි තෙරුන්ගේ ලෙන (සංඝයාට පරිත්‍යාග කිරීම).

උක්ත ශිලා ලේඛනයන්ට අනුව සාමාන්‍ය පිරිස්ද භික්ෂූන් වහන්සේලා උදෙසා පූජා කිරීම් සිදු කර ඇත. විශේෂයෙන් උපාසක යන නාමයෙන් හැඳින්වෙන පිරිස් ලෙන් පූජා කළ ශිලා ලේඛන ඇසුරෙන් පෙන්වා දිය හැකිය. මෙහිදී පෙර භික්ෂූන් වාසය කළ ලෙන් පසුව නැවත භාවිතයට හෝ පූජා කළ බවක් උක්ත ශිලා ලේඛනයන්ගෙන් පැහැදිලි වේ. විවිධ තෙරවරුන්ගේ නාමයෙන් හැඳින්වූ ලෙන් එම තෙරවරුන් වැඩසිටි ලෙන් විය හැකි අතර පසුව උන්වහන්සේලා එම ස්ථානයෙන් ඉවත් වීමෙන් පසුව නැවත එම ලෙන පිරිසිදු කොට පූජා කර ඇති බවක් උපකල්පනය කළ හැකිය. මෙහිදී විශේෂයෙන් සමාන්‍ය ජනතාව ලෙන් පිදූ බව තරයේම කිවනොහැකි අතර උපකල්පනය පමණක් සිදු කළ හැකිය. ලෙනක් නිර්මාණය කොට භික්ෂූන්ට පූජා කිරීම සඳහා යම් වූ ආර්ථික තත්වයක් තිබිය යුතුය. එසේ නම් වඩාත් හොඳින් ආර්ථික තත්වයක් නොමැති ජනයා කලින් නිර්මාණ කළ අතහැර දැමූ හෝ භාවිතයට නොගන්නා ලෙන් නැවත නිසි ලෙස පිරිසිදු කොට පූජා කළ බව ඒ අනුව උපකල්පනය කළ හැකිය.

## රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි අන්තර්ගත පුද්ගල නාම හා තනතුරු නාම

| පුද්ගල නාමය | තනතුර | පුද්ගල නාමයන් හා තනතුරු නාමයන් සඳහන් වී ඇති ශිලා ලේඛන ගණන |
|---|---|---|
| දෙවනපිය ගාමිණී තිස්ස | රජ, මහරජ | ශිලා ලේඛන 07 කි |
| ලජ්ජිතිස්ස | රජ | ශිලා ලේඛන 01 කි |
| අභය | මහරජ | ශිලා ලේඛන 01 කි |
| තිස්ස | කුමර | ශිලා ලේඛන 04 කි |
| බුද්ධදත්තා | උපාසිකා | ශිලා ලේඛන 01 කි |
| යසස්සිනී | උපාසිකා | ශිලා ලේඛන 01 කි |
| සාමිකා | උපාසිකා | ශිලා ලේඛන 01 කි |
| අභිජාතා | උපාසිකා | ශිලා ලේඛන 01 කි |
| දත්ත | උපාසක | ශිලා ලේඛන 02 කි |
| අභය | ගමික | ශිලා ලේඛන 01 කි |
| චේම | ගමික | ශිලා ලේඛන 01 කි |

| | | |
|---|---|---|
| මහින්ද | තෙර | ශිලා ලේඛන 01 කි |
| ඉට්ඨිය | තෙර | ශිලා ලේඛන 01 කි |
| ශිව | තෙර | ශිලා ලේඛන 03 කි |
| ගුත්ත | තෙර | ශිලා ලේඛන 02 කි |
| ඵුස්ස දේව | තෙර | ශිලා ලේඛන 01 කි |
| ධම්මරුචි | තෙර | ශිලා ලේඛන 03 කි |
| ඵුස්ස | තෙර | ශිලා ලේඛන 01 කි |
| තිස්සගුත්ත | තෙර | ශිලා ලේඛන 01 කි |
| ධම්මරක්ඛිත | තෙර | ශිලා ලේඛන 01 කි |
| නාගසේන | තෙර | ශිලා ලේඛන 01 කි |
| සූරි | තෙර | ශිලා ලේඛන 01 කි |
| බුද්ධ රක්ඛිත | තෙර | ශිලා ලේඛන 01 කි |
| තිස්ස භූති | තෙර | ශිලා ලේඛන 01 කි |
| නන්දික | තෙර | ශිලා ලේඛන 01 කි |
| නාග | තෙර | ශිලා ලේඛන 01 කි |
| තිස්ස මිත්ත | තෙර | ශිලා ලේඛන 03 කි |
| චිත්තගුත්ත | තෙර | ශිලා ලේඛන 01 කි |
| උපතිස්ස | තෙර | ශිලා ලේඛන 01 කි |
| අග්ගි | පරුමක | ශිලා ලේඛන 01 කි |
| තේජ | පරුමක | ශිලා ලේඛන 01 කි |
| ගොදත්ත | පරුමක | ශිලා ලේඛන 01 කි |
| පණිතිස්ස | පරුමක | ශිලා ලේඛන 01 කි |
| සෝණ | - | ශිලා ලේඛන 01 කි |
| සිවගුත්ත | - | ශිලා ලේඛන 01 කි |
| සිවභූති | - | ශිලා ලේඛන 01 කි |

## රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හී අන්තර්ගත ලෙන් නාම, ගුහා නාම හා පර්වත නාම

- සමන්ත භද්‍ර ලෙන - මෙම ලෙනෙහි අයිතිය පිළිබඳ සඳහන් වී ඇත්තේ ගමික චේමගේ ලෙන වශයෙනි.
- සීහමුඛ ලෙන - මෙම ලෙන තිස්ස ගුත්ත තෙරුන්ගේ ලෙන වශයෙන් දක්වා ඇති අතර සීහමුඛ යනු සිංහ කටය යන්නය. ඇතැම් විටකදී ලෙනේ ස්වාභාවය අනුව මෙම ලෙනට මෙවැනි නාමයන් භාවිත වන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. සීගිරියේ නයිපෙන ගුහාව, රජගල වවුල් ලෙන ආදී ගුහාවන්ට නාම යෙදී ඇත්තේ එහි ස්වාභාවය අනුවය. මේ අනුව පුරාණයේද ස්වාභාවය අනුව නාම යෙදෙන්නට ඇති බව දැක්විය හැකිය.
- සුප්පතිට්ඨිත ලෙන - සුප්පතිට්ඨ යනු මැනවින් පිහිටි යන අර්ථය ගෙන දෙනු ලැබේ. මෙම ලෙනෙහි අයිතිය තහවුරුව ඇත්තේ සිව භූතිගේ ලෙන වශයෙනි.

- සුදස්සන ලෙන - මෙම ලෙන් නාමය පිළිබඳ සෙල්ලිපි දෙකක සඳහන් වී ඇත. නාගසේන තෙරුන්ගේ සුදස්සන ලෙන හා තිස්ස තෙරුන්ගේ සුදස්සන ලෙන වශයෙනි. සුදස්සන නාමය ශිලා ලේඛනයන්හි භාවිත වී ඇති නාමයක් වන අතර පෙරියන්කුලම ගිරි ලිපිය වැනි ශිලා ලේඛනයන්හි සුදසන පතනගල වශයෙන් යෙදී ඇත.[37] එසේම මහා සුදශන ලෙණෙ, බත දිනශ ලෙණෙ ශුදශනෙ වශයෙන් ආඬියා කන්ද හා වැලියාය සෙල් ලිපිවල දක්වා ඇත.[38]
- මනාපදස්සන ලෙන - තිස්ස භූතී තෙරුන්ගේ ලෙන වශයෙන් තත් ලෙන දක්වා ඇති අතර මනාපදස්සන ලෙන වශයෙන් ශිලා ලේඛන කිහිපයකම දක්නට ලැබේ. මෙහිදී බඹරගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ශිලා ලේඛනයකද 'උතර ගුත තෙරහ ලෙණෙ මනපදශනෙ' යනුවෙන් යෙදී ඇත.[39] එසේම තිස්සභූතිගේ මනාපදස්සන ලෙන වශයෙන් මිහින්තලා සෙල්ලිපිවල දක්වා ඇත.[40] මේ අනුව මනාපදස්සන නාමය ශිලා ලිපි ගණනාවක යෙදී ඇති අතර එය කාලයත් සමඟ භාවිතා වූ පොදු නාමයක්ද විය හැකිය. එහි අර්ථය වනුයේ දැකීමට ප්‍රිය වන්නාවූ යන්නය.
- භයභේරව ලෙන - බුද්ධරක්ඛිත තෙරුන්ගේ ලෙනක් වශයෙන් දක්වා ඇති අතර රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හී දක්නට හැකි ලෙන් නාමයක් වශයෙන් මෙය දැක්විය හැකිය.
- ඉන්දසාල ගුහා ලෙන - මෙම නාමය සහිත ශිලා ලේඛන දෙකක් දක්නට ලැබේ. මෙම නාමය පිළිබඳ සඳහන් කිරීමේදී බඹරගල ශිලා ලේඛනයන්හීද මෙම නාමය දක්නට හැකි වන්නේය. ඉන්දසාල ලෙන යනු බෞද්ධ සාහිත්‍යයේ පවා දැක්වෙන නාමයකි. බුදුරජුන් සක්දෙවිඳුන් හට ධර්මය දේශනා කරන ලද්දේ ඉන්දසාල ගුහාවේ සිට බව බෞද්ධ සාහිත්‍යයේ දක්නට ලැබේ.
- පුඩලකඩකෙ ලෙන - තිස්ස මිත්ත තෙරුන්ගේ පුඩලකඩක ලෙන ලෙස දක්වා ඇති මෙම ලෙන් නාමය රජගල ශිලා ලේඛනයන්හි දක්නට හැකිය.
- චනතිස්ස පබ්බතය - රජගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි දක්නට ලැබෙන පර්වත නාමයක් වශයෙන් චනතිස්ස යන්න හඳුන්වා දිය හැකිය. මෙම පර්වතයේ ඵුස්ස තෙරුන් වැඩවසන බව දක්වා ඇත.

## නිගමනය

උක්ත ශිලාලේඛනයන්හි අන්තර්ගත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී ලංකා ඉතිහාසයේ වැදගත් කරුණක් වශයෙන් සාහිත්‍යය මූලාශයන්හි හා වංශකථා සාහිත්‍යයේ සඳහන් වනු ලබන මිහිඳු මාහිමියන්ගේ ලංකාගමන පිළිබඳ සත්‍යතාවයක් පෙන්නුම් කරන තත් ශිලා ලේඛනය වැදගත් වේ. ඒ අනුව වංශකථාවන්හි අන්තර්ගත කරුණු සනාථ කිරීමට යථෝක්ථ ශිලා ලේඛනය සමත් වී ඇත. එසේම ක්‍රි.පූ. යුගයේ සිට ක්‍රි.ව. යුගය දක්වා ලංකාවේ විවිධ පිරිස් විසින් ප්‍රදානය කළ ලෙන් පිළිබඳ ලංකාවේ විවිධ ස්ථානයන්හි දක්නට ලැබේ. මේ අනුව රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේද විවිධ පිරිස් විසින් ප්‍රදානය කළ ලෙන් හා ගුහා දැකගත හැකි වේ. එම ලෙන්හි සඳහන් වී ඇති ශිලා ලේඛන මඟින් රජවරුන්, කුමර, කුමරියන්, උපාසිකාවන්, උපාසකයන්, පරුමකවරුන්, ගමිකවරුන් ආදී පිරිස් මෙම ලෙන් පිදූ බව තහවුරු වනු ලැබේ. එසේම මහාවංශයේ සඳහන් වන පරිදි ලජ්ජිතිස්ස රජතුමා විසින් මෙම විහාරය නිර්මාණ කරන ලදී. මෙම කරුණ යම් ආකාරයකින් සනාථ කිරීමට උක්ත ශිලාලේඛනයේ අඩංගු වන ගීත ලෙන් විසිපහ පූජාකිරීම දැක්වෙන ශිලාලේඛන වැදගත් සාධකයක් වේ. එසේම සමකාලීන සමාජයේ භාවිතා වූ නාම, තනතුරු හා ලෙන් නාම පිළිබඳ ශිලා ලේඛන අන්තර්ගතයෙන් තහවුරු වෙයි. මේ අනුව මූලික වශයෙන් රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන මඟින් සාහිත්‍ය මූලාශයන්හි හා වංශකථාහි අන්තර්ගත තොරතුරු හා තත් සමාජයේ බුදුසසුන කෙරෙහි ප්‍රභූ පිරිස් හා සමාන්‍ය ජනයා කුමන ආකාරයෙන් අනුග්‍රහයන් සිදු කළේද යන්න සනාථ කිරීමට සාධක සපයනු ලැබේ.

**ආන්තික සටහන්**

[1] **මහා වංශය සිංහල**, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012. පරි. 33, පිටුව 139.

[2] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 100.

[3] **මහා වංශය සිංහල**, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012. පරි. 33, පිටුව 55.

[4] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 100.

[5] නන්දසේන මුදියන්සේ, **එම**, 2000, පිටුව 97.

[6] **එම**, පිටුව 98.

[7] **එම.**

[8] **එම**, පිටුව 100.

[9] **එම**, පිටුව 99.

[10] කොත්මලේ අමරවංශ හිමි, **ලක්දිව සෙල්ලිපි**, කොළඹ: ගුණසේන සහ සමාගම, 1969, පිටු 65, 115, 124.

[11] කොත්මලේ අමරවංශ හිමි, **ලක්දිව සෙල්ලිපි**, කොළඹ: ගුණසේන සහ සමාගම, 1969, පිටු 66, 67, 69, 72, 73, 74, 78, 81, 82, 83, 86, 89, 93.

[12] **එම**, පිටුව 90.

[13] **එම**, පිටු 66, 80, 85, 86, 87, 89, 90, 110, 121

[14] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 99.

[15] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 100.

[16] **එම**, පිටුව 99.

[17] **එම.**

[18] කොත්මලේ අමරවංශ හිමි, **ලක්දිව සෙල්ලිපි**, කොළඹ: ගුණසේන සහ සමාගම, 1969, පිටු 69, 72, 80, 82.

[19] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 100.

[20] **එම.**

[21] **එම.**

[22] **එම.**

[23] **එම.**

[24] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 99.

[25] **එම**, පිටුව 100.

[26] **එම**, පිටුව 100.

[27] **එම**, පිටුව 97.

[28] **එම**, පිටුව 100.

[29] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 97.

[30] **එම**, පිටුව 100.

[31] **එම**, පිටුව 98.

[32] **එම**, පිටුව 100.

[33] එම, පිටුව 99.

[34] නන්දසේන මුදියන්සේ, **සිංහල ශිලා ලේඛන සංග්‍රහය**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පිටුව 99.

[35] **එම**, පිටුව 100.

[36] එම, පිටුව 99.

[37] කොත්මලේ අමරවංශ හිමි, **ලක්දිව සෙල්ලිපි**, කොළඹ: ගුණසේන සහ සමාගම, 1969, පිටුව 119.

[38] එම, පිටුව 110.

[39] එම, පිටුව 90.

[40] එම, පිටුව 70.